[අන්තර්ජාල අනුවාදයකි]

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 7 දරන කෑගල්ල තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1999 මාර්තු මස 26 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 මාර්තු මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ රු.5. 75 යි    තැපැල් ගාස්තුව රු.3.50 යි.

## 1999 අංක 7 දරන කෑගල්ල තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1999 මාර්තු මස 26 වැනි දින.]

එල්.ඩී. - ඕ. 44/96.

### කෑගල්ල තරුණ බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"කෑගල්ල තරුණ බෞද්ධ සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සමිතියක්, එකී සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සමිතියට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු එලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් කෑගල්ලේ පිහිටුවා තිබූ හෙයින් ද ; පූර්විකාව.

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සමිතිය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී සමිතිය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 1999 අංක 7 දරන කෑගල්ල තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) කෑගල්ල තරුණ බෞද්ධ සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "කෑගල්ල තරුණ බෞද්ධ සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේය. තවද ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද එම නාමයෙන් සියලු අධිකරණයන්හි නඩු පැවරීම සහ නඩු පවරනු ලැබීම කළ හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමට ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද, පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. කෑගල්ල තරුණ බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත දැක්වෙන පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:- සංස්ථාවේ පොදු පරමාර්ථ.

*(අ)* බුද්ධ ධර්මය පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම, බුද්ධාගම පිළිබඳ දැනුම බෙදාදීම ;

(ආ) බුද්ධාගම ක්‍රියාත්මක ලෙස ඇදහීමට ධෛර්යය දීම ;

(ඇ) බෞද්ධයන් අතර සමගිය හා සහයෝගය ප්‍රවර්ධනය කිරීම;

(ඈ) බෞද්ධයන්ගේ සංස්කෘතික, සමාජයීය හා අර්ථික සංවර්ධනය සඳහා කටයුතු කිරීම ;

(ඉ) බෞද්ධයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා කටයුතු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව බැංකු ගිණුම් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ආධාර මුදල් හා පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම ද ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් ඉටු කරගැනීම සඳහා සහ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ රීති වලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ සහ ඒ රීති වලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන නිලධරයන් ගෙන් සහ සෙසු තැනැත්තන්ගෙන් ද සමන්විත කළමනාකර මණ්ඩලයක් විසින් සංස්ථාවේ තත්කාලයේ රීති වලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන සංගමයේ කළමනකාර මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම කළමනාකාර මණ්ඩලය විය යුතු අතර පළමුවන කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයන් මේ පනතේ උපලේඛනයේ නම් සඳහන් තැනැත්තන් විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවේ යම් මහා සභා රැස්වීමකට පැමිණ සිටින සහ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන්

කිසිවක් සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :-

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළු කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ ඔවුන් සාමාජිකත්වයෙන් නෙරපීම ;

(ආ) නිලධරයන් තෝරා පත්කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන්ගේ ධූරය හිස් කිරීම හෝ ඔවුන් ධූරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්ය ;

(ඇ) කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සහ කළමනාකරණ මණ්ඩලයේ බලතල, චර්යාව සහ කාර්ය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම් කැඳවීම, රැස්වීම් පැවැත්වීම, රැස්වීම් පවත්වන වේලාවන්, ස්ථාන, රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යාය පත්‍රය, රැස්වීම්වල ගණපූරණය සහ රැස්වීම්වල දී සාකච්ඡා කළ යුතු කරුණු ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වා ගෙන යාම සහ විගණනය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද කවර වුවද රීතියක් (1) වන උපවගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන්ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීති වලට යටත් විය යුතු ය.

සංගමයෙන් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය.

7. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයේ පැවැති සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවිය යුතු අතර එදිනට සංගමයට අය විය යුතු හෝ ගෙවිය යුතු සියලු ණය දායක මුදල් සහ සහභාගි මුදල් මේ පනතේ කාර්ය සඳහා මෙයින් ඇති කරන ලද සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් හැකියාව සහ ශක්‍යතාව තිබිය යුතු ය. එවැනි සියලු දේපළ මේ පනතේ කාර්ය සඳහා සහ තත්කාලයේ බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාව විසින් දැරිය යුතු ය. එම දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමට සංස්ථාවට බලය තිබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

9. සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ ගරු ප්‍රධාන ලේකම්වරයාගේ භාරයේ තබා ගත යුතු ය. ගරු ප්‍රධාන ලේකම් සහ සභාපතිවරයා හෝ ගරු භාණ්ඩාගාරිකවරයා යන දෙදෙනාගෙන් කෙනෙකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිඳු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඔවුන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තවද එම අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් වෙනුවෙන්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම් වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය [5 (2) වන වගන්තිය]

නිලධාරි මණ්ඩලය

| | | |
|---|---|---|
| ගරු සභාපති | : | කේ . එස්. පණ්ඩිතරත්න මයා |
| උප සභාපතිවරු | : | පී.ඒ. තෙන්නකෝන් මයා |
| | | එච්. අර්. යූ. නිශ්ශංක මයා |
| | | ඩබ්. සෝමදාස මයා |
| ලේකම් | : | ලක්ෂ්මන් ඒකනායක මයා |
| උප ලේකම් | : | වසන්ත විජය නන්දන මයා |
| භාණ්ඩාගාරික | : | ටී.බී. දොඩන්වල මයා |
| කාරක සභිකවරු | : | පියසිරි ලියනගේ මයා |
| | | ජේ. චන්ද්‍රසේන මයා |
| | | කේ. ජී. පියතිස්ස මයා |
| | | ඩබ්. සාගරරත්න මයා |
| | | ඩබ්. එම්. ඒ. විජේතුංග මයා |
| | | රොමෙල් විජේවර්ධන මයා |
| | | ඩබ්. ඒ. එස්. කේ. වික්‍රමආරච්චි මයා |
| | | පියසේන පතිරණ මයා |
| | | බී. ඩී. දංගම්පල මයා |
| | | බී. ඒ. සෝමරත්න මයා |
| | | එච්. ආර්. ඩබ්. සේනානායක මයා |
| | | ඩී. කුමානායක මයා |
| | | කේ. ආර්. ඩී. සුනිල් ගුරුසිංහ මයා |
| | | පාලිත ධර්මදාස මයා |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.